# කියැවීමේ අවසානය ?

**1999 වර්ෂයේ සිට ඇමරිකානු ගැටවරයන්ගේ කියවීමේ රුචිකත්වය වැඩි වී නොමැත. එරට ජාතික අධ්‍යාපනය දියුණු කිරීමේ වාර්තා තුළින් ඒ බව කියැවෙයි. හැරී පොටර් ප්‍රබන්ධ කෘති ඔවුන්ගේ කියවීමේ රුචිකත්වය දිනා සිටිය ද එතුළින් ද අවශ්‍ය කියවීම් ප්‍රතිශතයට ළඟා වී නොමැත. ගැටවරවියේ පසුවන ළමුන් බොහෝ කාලයක් ගත කරන්නේ වීඩියෝ ක්‍රීඩා සහ අන්තර්ජාලය සමඟ බව වාර්තා වේ.**



වේගයෙන් වෙනස්වන සමාජ වටපිටාවෙහි ඔවුන්ගේ නිරන්තර අවධානයට පාත්‍ර වන්නේ දෘෂ්‍ය මාධ්‍යයි. එලෙස විද්‍යුත් සංස්කෘතියට හැඩ ගැසී ඇති ඔවුන් ගේ මොළ සාමාන්‍ය පරිසර තත්ත්වයන්ට අනුගතව කෙරෙන අධ්‍යාපනික ඉගැන්වීම්වලට නොගැලපෙන තත්ත්වයකට පත් වී ඇත. ළමා මොළයේ පරිහානිය පිළිබඳ එසේ අදහස් දක්වා ඇත්තේ මනෝවිද්‍යාඥ ජේන් හෙළී"Endangered Mind"නැමැති කෘතිය තුළිනි. හෙළී තවදුරටත් මෙසේ ද අදහස් ප්‍රකාශකර ඇත. එනම්, "ලිවීම යනු නිරන්තරයෙන් පරණ වන කලාවක් ය. දෘශ්‍ය මාධ්‍ය යනු වේගයෙන් මනසට ගෝචර වන්නක් ය" යනුවෙනි.

හෙළී වැනි උගතුන්, නූතන ප්‍රවණතාවට එරෙහිව යමින් කියැවීමේ පුරුද්ද යළි ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුව ඇත.

විශිෂ්ට සංස්කෘතික උරුමයන් තිබෙන සමාජයෙන් කියැවීමේ රුචිය පහළ යාමේ අවදානම ඉවත් කළ යුතු ය. එමෙන්ම මෙම අරගලය සිදු කිරීමේ දී නූතන තාක්ෂණය හා සංස්කෘතික උරුමයන් අතර ඝට්ඨනයක් ඇති නොවීමට ද වගබලා ගත යුතු ය. එනම් සැම ක්ෂේත්‍රයක්ම ප්‍රයෝජනවත් ලෙස දැකිය යුතුව ඇත.

දෘෂ්‍ය මාධ්‍යයක් වන අන්තර්ජාලයේ වාක්‍යාංශ භාවිත කරයි. එමඟින් හැඟියන්නේ විවිධ වූ ක්ෂේත්‍රයන්හි ඇති සම්බන්ධතාව යි. අවුරුදු දහස් ගණනක් ලෝකය පුරා මිනිස්සු භාෂාවක් නොමැතිකමින් මංමුලාවී සිටියහ. ඉන් අවුරුදු දහස් ගණනකට පසු හෝඩියක් නිර්මාණය විය.

ජේන් හෙළීගේ "Orality and Literavy"නමැති කෘතියෙහි ඒ බව සඳහන්ව ඇත.හෙළීගේ ශිෂ්‍යයෙක්ව සිටි වෝල්ටර් ඔන්ග් හෙළීගේ ආරම්භක මතවාද ඉදිරියට ගෙන යමින් මෙසේ අදහස් දක්වා තිබේ. හෝමෝසේපියන් මානවයා ලෝකයට අවතීර්ණ වූ මෙම කාලවකාවානුවෙහි ඉහත හෝඩියේ ආභාෂය මත කතා කිරීම ආරම්භකර ඇත.

එසේ කළ සන්නිවේදනයේ සම ශබ්ද එකතු වී භාෂා මාධ්‍යයක් බිහි වී ඇත. ක්‍රි.පූ.5 වැනි සියවසේ දී වූ සංස්කෘතිය තුළ, කතා කිරීම හා ලිවීම සංස්කෘතිකාංගයක් බවට පත්වී තිබිණි.




මෙකල ජීවත් වූ ප්ලේටෝ නැමැති දර්ශනිකයා තම දර්ශනවාද ඉදිරිපත් කිරීමට භාෂාව නවෝත්පාදකව යොදගත ඇත. ප්ලේටෝ ලිවීම පිළිබඳ ඉදිරිපත් කළ අදහස් නම් "ලිවීම මතක තබා ගැනීම අඩු කිරීමට බලපායි." එමෙන්ම ලිවීම පසුගාමී මාධ්‍යයක් ය.

මුඛ විවාද වඩා උසස් බවත්, ලිවීම යනු විවාද සඳහා ආදරකයක් පමණක් බවත් ග්‍රීක දර්ශනික සොක්‍රටීස් පවසා ඇත.

පරිගණකය පැමිණීමත් සමඟ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව විශාල ලෙස පුළුල් වී ඇත. ලියන වචනවලට වඩා වැඩි සේවාවක් පරිගණකයෙන් සිදු කරයි. පරිගණකය තවමත් තිබෙන්නේ ආරම්භක අවධියේමය. එය තව දුරටත් දියුණු වී අප ප්‍රකාශ කරන දෙය මුද්‍රණ වී "Printout"ලෙස අපට ලබාගැනීමට හැකිවීම වැනි ද සිදුවුවහොත් පරිගණකය තව දුරටත් අලුත් "උපකරණයක්" ලෙස සැලකීමට කිසිවකු ඉදිරිපත් නොවනු ඇත.

පීටස්බර්ග් හි පිහිටි Carnegie Mellon"විශ්වවිද්‍යාලයෙහි ස්නායු පිළිබඳ විශේෂඥයකු වන මාෂල් ජස්ට් පවසන පිරිදි මිනිසාගේ ස්වාභාවික මාධ්‍යය දෘෂ්‍ය මාධ්‍යය යි. පරිණාමයේ දී හෝමෝ සේපියන් මානවයාගේ දෘෂ්‍ය සන්නිවේදනය කදිමට දියුණු වී ඇත. හෙවනැල්ලක සුළු චලනයක් පවා හඳුනාගැනීම ඔවුන්ට හැකිවී ඇත. එනමුදු ලිවීමට හැකියාව ලබාගැනීම ඉතා අමාරු කර්තව්‍යයක් ය. එය ඉගෙනගැනීමට බොහෝ කලක් ගත වේ. ලියා ඇති වචනවලට වඩා ඉක්මනින් වීඩියෝ ක්‍රීඩාවක් අපට අවබෝධ කරගත හැකිය. ලිවීම හා කියැවීම අප සංස්කෘතියට අහම්බෙන් ඇතුළු වූ කෘතිම සංස්කෘතිකාංගයන් ය.

සමහර මිනිසුන්ගේ මතයක් වන්නේ අන්තර්ජාලයේ සටහන්ව ඇති වදන් භාවිත නොවන බවයි. නමුත් එහි සත්‍ය අසත්‍යතාව එකවිටම පැවසිය නොහැකි ය. ලිඛිත තාක්ෂණයට වඩා දෘෂ්‍ය තාක්ෂණය ප්‍රබල ව භාවිත කරන්නත් , වචනවලට නොයා දෘෂ්‍ය සංජානනහැකියාව මත ක්‍රියාකාරකම්වලට යොමු වීම ස්වාභාවිකය. අනාගත පරපුර නවකතාවක් කියැවීමට අවධානය යොමු නොකරනු ඇත. එයට විකල්ප වශයෙන් නව දෘෂ්‍ය මාධ්‍යයයක් ඇති විය හැකිය.

දෘෂ්‍ය මාධ්‍යානුසාරව ලිවීම, භාෂාව, මුද්‍රණය, විද්‍යුත් පොත් බැලීම ආදී ක්‍රියාකාරකම් සඳහා මොළයේ එක් එක් ප්‍රදේශ සම්බන්ධිත වෙයි. තවත් දෙසකින් රූ සටහන් බලා සහ වාක්‍යාංශ දෙස බලා අප යම් දේවල් තේරුම් ගනිමු. නමුත් රූ සටහනක් ග්‍රහණයේ දී තරම් ප්‍රබල අවබෝධයක් වාක්‍යාංශ ග්‍රහණයේ දී මොළය තුළ සිදු නොවෙයි.

ඉහත මත අනුව, ඉදිරි පරම්පරාවට යහපත් මනසක් හිමිවීමට නම් පොත් කියැවීම ද සමඟ දෘෂ්‍ය මාධ්‍යයක් භාවිත කිරීම ද අත්‍යවශ්‍ය වනු ඇත. ❑

**පරිගණකය පැමිණීමත් සමඟ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව විශාල ලෙස පුළුල් වී ඇත. ලියන වචනවලට වඩා වැඩි සේවාවක් පරිගණකයෙන් සිදු කරයි. පරිගණකය තවමත් තිබෙන්නේ ආරම්භක අවධියේමය. එය තව දුරටත් දියුණු වී අප ප්‍රකාශ කරන දෙය මුද්‍රණ වී "Printout"ලෙස අපට ලබාගැනීමට හැකිවීම වැනි දෑ සිදුවුවහොත් පරිගණකය තව දුරටත් අලුත් "උපකරණයක්" ලෙස සැලකීමට කිසිවකු ඉදිරිපත් නොවනු ඇත.**

**පුබුදු කිත්සිරි**